# සුමිතුරු

2016 මාර්තු - අප්‍රේල් 3 - 4 කලාපය



# රුපියලේ ගමන්මග 2

ISSN 2513-3012

9 780041 001044

රු. 20/-

ශ්‍රී ලංකා මහ බැංකුව, සන්නිවේදන දෙපාර්තමේන්තුව





ටොලමිගේ ලෝක සිතියමේ ශ්‍රී ලංකාව

# ලොකු ඇයි?




ක්‍රි.ව. 150 තරම් ඈතක, රෝමානු ගණිතඥයකු වූ ටොලමි, තමන් සකස් කළ ලෝක සිතියමේ ලංකාවේ පිහිටීම හරියට ලකුණු කරලා තිබුණා. එහෙත් ඔහු 'තැප්‍රොබානා' ලෙස නම් කළ ලංකා ද්වීපය ප්‍රමාණයට වඩා ලොකුවටයි ඇඳලා තියෙන්නේ.

මුහුදු සේද මාවතේ හරි මැද පිහිටි මේ දිවයින, ටොලමි ගේ පරිකල්පනයට ලොකුවට පෙනුනේ අහම්බෙන් ද? නැති නම් නැගෙනහිරින්, බටහිරින් පැමිණි වෙළෙන්දන්, දේශ ගවේශකයන් එකට මුණගැසුනු, ජාත්‍යන්තර ආර්ථිකයක කේන්ද්‍රස්ථානය වූ ලංකාවේ ආර්ථික කටයුතුවල කීර්ති ප්‍රභාව, මේ කුඩා දිවයින විශාලනය කර දැක් වූ නිසා ද?

හාරා අවුස්සා, සොයාගෙන, දැනගෙන, අනාගතය සඳහා තැන්පත් කළ යුතු ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය පිළිබඳ දැනුම එක ම වහලක් යටට ගොනු කරන ජාතික ව්‍යාපෘතිය.

**ශ්‍රී ලංකා ආර්ථික ඉතිහාස කෞතුකාගාරය**
**The Economic History Museum of Sri Lanka**

පුරාණයෙන් රැඩියලට

**ව්‍යවහාර මුදල් දැක්ම**
**කොළඹ කොටුව, චැතම් වීදියේ**
**සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ලේ**
**මහජන ප්‍රදර්ශනය සඳහා විවෘතයි.**

සඳුදා සිට සෙනසුරාදා පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා විවෘතයි.
කණ්ඩායමක් වශයෙන් පැමිණෙන්නේ නම් දිනයක් සහ වේලාවක් කලින් වෙන් කරවාගෙන පැමිණෙන්න
දුරකතන : 2444502, 2477421, 2477132, 2477257
ෆැක්ස්: 112346304





"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.


සටහන

සන්නිවේදන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් පහත සඳහන් ලිපිනයට එවීමෙන් "සටහන" තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

පිටපතක මිල : රු. 20.00
වාර්ෂික දායකත්වය : රු. 480.00
(තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ

35 වෙළුම 3-4 කලාපය 2016 මාර්. - අප්‍රේ. ISSN 1391-3697

**අතීතයේ සිට වර්තමානය දක්වා ශ්‍රී ලංකා ව්‍යවහාර මුදලේ විකාශනය පැහැදිලි කෙරෙන මෙම ලිපියේ මුල් කොටස 2016 ජනවාරි - පෙබරවාරි "සටහන" කලාපයේ පළවිය.**

# ශ්‍රී ලංකා රුපියලේ ගමන් මග

## 2

**විනීතා හේරත්, මාතලේ ප්‍රාදේශීය කාර්යාලය**

### ආර්ථික පිළිලයකට එරෙහිව ආරක්ෂණ පියවර තර කෙරෙයි

ලොව මුදල් භාවිතය ඇරඹූ දා සිට ම ඒවායේ අනුකරණ හොරට නිෂ්පාදනය කොට සංසරණයට මුදාහැර තිබෙනවා. එය කාසි හා නෝට්ටු භාවිතය ඇරඹීමට පෙර භාණ්ඩ මුදල් ගනුදෙනු සඳහා යොදාගත් අවධියේ පවා සිදුවූවක් යැයි විශ්වාස කළ හැකියි. අද අප ව්‍යාජ මුදල් ලෙස හඳුන්වන්නේ මේවා යි. මෙම උවදුර පිටුදැකීමට ගෙන ඇති පියවර ද රැසයි. ඉන් එක් පියවරක් වූයේ මුදල් නිකුත් කිරීමේ ආධිපත්‍යය තහවුරු කිරීම යි. එම ආධිපත්‍යයට එරෙහිව යමින් හොර මුදල් නිෂ්පාදනය කළ අයට මරණ දඬුවම පැනවූ අවස්ථා පවා ලොව නොයෙකුත් රටවලින් වාර්තා වී තිබෙනවා. කෙසේ වෙතත් කවරාකාර දඬුවමකින් වුවත් ව්‍යාජ මුදල් නිෂ්පාදනය මුළුමනින් ම වැළැක්වීම ඉතාමත් ම අපහසු කටයුත්තක්. ඊට එරෙහිව තාක්ෂණික උපක්‍රම වැඩි දියුණු කිරීමට මූල්‍ය බලධාරීන් පියවර ගෙන ඇත්තේ ඒ නිසා යි. ඒ අනුව මේ වන විට ව්‍යාජ මුදල් නිපදවන්නන්ට අනුකරණය කළ නොහැකි තාක්ෂණික ක්‍රම මුදල් නෝට්ටු නිෂ්පාදනයේ දී භාවිතයට ගනු ලබනවා.

ශ්‍රී ලංකා මහ බැංකුව ද වරින් වර නව මුදල් නෝට්ටු කාණ්ඩ හඳුන්වා දෙන අතර ම ව්‍යාජ මුදල් නෝට්ටු නිෂ්පාදනය වැළැක්වීමේ පියවර ලෙස නෝට්ටු සඳහා විවිධ ආරක්ෂණ සලකුණු රැසක් ද හඳුන්වා දී තිබෙනවා. මෙම ආරක්ෂණ සලකුණු යෙදීම දෙයාකාරයකින් සිදුකරනවා. ඇතැම් ආරක්ෂණ සලකුණු යොදන්නේ නෝට්ටු සඳහා කඩදාසි නිෂ්පාදනය කරන අවස්ථාවේදී ම යි. අනෙක් ආරක්ෂණ සලකුණු යොදන්නේ නෝට්ටු මුද්‍රණයේ දී. ඒ අනුව:

### ශ්‍රී ලංකාවේ පෞරාණික උරුමයන් විදහා දක්වන නෝට්ටු කාණ්ඩයට ඇතුළත් කළ ආරක්ෂණ සලකුණු

#### මුද්‍රණ කඩදාසිය

සැබෑ මුදල් නෝට්ටුවක කඩදාසිය මෘදු, සිනිඳු, දිලිසෙන හෝ ඉටි ගෑ ස්වභාවයෙන් තොරයි. එය ස්පර්ශකර බැලීමේ දී තීන්ත ඝන ව මුද්‍රණය කර ඇති ස්ථාන ඉහළට ඉස්මතු වූ සලකුණු ඇඟිලි තුඩුවලට දැනේ. මෙම තාක්ෂණය හඳුන්වනු ලබන්නේ "ඉන්ටැග්ලියෝ" මුද්‍රණය ලෙස යි.

#### ආරක්ෂණ නූල

රුපියල් 10, 20, 50 සහ 100 නෝට්ටුවල ආරක්ෂණ නූල නිමවා ඇත්තේ කඩදාසියට කාවදින ලෙස යි. එය Central Bank of Sri Lanka යන්න ඉතා කුඩා අකුරින් මුද්‍රණය කරන ලද පොලියෙස්ටර් නූලක්. රුපියල් 500 සහ 1000 නෝට්ටුවල කඩදාසියට කා වැද්දූ ආරක්ෂණ නූල රිදී පැහැති කඩ ඉරි සේ දැකිය හැකි යි. නෝට්ටුව ආලෝකයට යොමුකොට බැලූ විට මෙම නූල දිස්වෙන්නේ අඛණ්ඩ සිරස් රේඛාවක් ලෙස යි. මෙම ලෝහමය නූල හඳුන්වන්නේ "ස්ටාර් වයිඩ්" නමින්. රුපියල් 500 නෝට්ටුවේ මිලි මීටර් 3ක් පළලින් යුත් නූලෙහි ශ්‍රී ලංකාවේ ඩේසි මල් මෝස්තරයක් ද රු. 1000 නෝට්ටුවේ මිලි මීටර් 4 ක් පළලින් යුත් නූලෙහි පැසක වියමනකට සමාන රටාවක් ද පැහැදිලිව දක්නට ලැබෙනවා. 2006 වර්ෂයේ දී නිකුත් කරන ලද රුපියල් 2000 නෝට්ටුවෙහි යොදා ඇති ආරක්ෂණ නූල "ස්ටාර් ක්‍රෝම්" ලෙස හඳුන්වනු ලබන අතර නෝට්ටුව උස් පහත් කර බැලීමේ දී මෙම නූලෙහි වර්ණය දිස්වෙන්නේ වරෙක තද රතු පාටින් හා වරෙක කොළ පාටින්. සමනළ රූපයක් සමඟින් නෝට්ටුවේ වටිනාකම රුපියල් 2000 යන්න නූල දිගේ දැකිය හැකියි. 2005 වර්ෂයේ සිට නිකුත් කරන ලද රුපියල් 500 නෝට්ටුවේ එතෙක් යොදා තිබූ මිලි මීටර් 3 ක් පළලින් යුත් ස්ටාර් වයිඩ් ආරක්ෂණ නූල වෙනුවට මිලි මීටර් 3 ක් පළලින් යුත් ස්ටාර් ක්‍රෝම් ආරක්ෂණ නූල ද 2006 වර්ෂයේ සිට නිකුත් කරන ලද රුපියල් 1000 නෝට්ටුවේ එතෙක් තිබූ මිලි මීටර් 4 ක් පළලින් යුත් ස්ටාර් වයිඩ් ආරක්ෂණ නූල වෙනුවට මිලි මීටර් 4 ක් පළලින් යුත් ස්ටාර් ක්‍රෝම් ආරක්ෂණ නූල ද යොදා තිබෙනවා.

## දිය සලකුණ

නෝට්ටුව ආලෝකයට යොමු කොට බැලූ විට සිංහයෙකුගේ සලකුණක් පැහැදිලිව දැකිය හැකි යි. මෙය ශ්‍රී ලංකාවේ ජාතික කොඩියේ දැක්වෙන සිංහ රූපයෙහි අනුරුවක් වන අතර අත දරා සිටින කඩුව වෙන් ව ඉස්මතුවී පෙනේ.

## විනිවිද පෙනෙන සලකුණ

නෝට්ටුව ආලෝකයට යොමු කොට බැලූ විට එහි මුහුණත සහ පිටුපස එකිනෙකට සමපාත වෙන පරිදි මුද්‍රණය කර ඇති හැඩතල හෝ මෝස්තර දක්නට හැකි යි.

## ස්පර්ශයට දැනෙන ඉරි සලකුණු

රුපියල් 2000 නෝට්ටුවේ වම් සහ දකුණු පස තීරුවල මැදට වන්නට ඉරි රටා යොදා තිබෙන අතර ඒවා ස්පර්ශයේදී රළු ස්වභාවයෙන් දැනේ. මේ නිසා දෘෂ්‍යාබාධිත අයට වුව ද නෝට්ටුව පහසුවෙන් හඳුනාගත හැකි යි.

## දිළිසෙන පටිය

නෝට්ටුවේ පිටුපස නෝට්ටුව දිගේ සිරස් අතට ගමන් කරන්නා වූ රන් පැහැති දිලිසෙන පටියක් මුද්‍රණය කර තිබෙනවා.

## බහු ස්ථර සැඟවුන සළකුණ

නෝට්ටුව ඇස් මට්ටමින් තිරස්ව ඇලකර බලන විට එහි වටිනාකම සඳහන් සැඟවුන සංකේතයක් දක්නට ලැබෙනවා. සාමාන්‍යයෙන් මෙම ලක්ෂණය දක්නට ලැබෙන්නේ නෝට්ටුවල පහළ මැද කොටසේ යි.

## වැර ගැන්වූ කොන්

2005 නොවැම්බර් 19 වැනි දිනෙන් පසුව නිකුත් කරන ලද රුපියල් 2000 සහ රුපියල් 500 නෝට්ටුවල ද 2006 ජූලි 03 වැනි දිනෙන් පසුව නිකුත් කරන ලද රුපියල් 1000 නෝට්ටුවල ද නෝට්ටුවේ සිව්කොනේ විකර්ණ රේඛා ලෙසින් දිවෙන විශේෂිත දිය සලකුණක් දැකිය හැකියි. මෙම සලකුණ හැඳින්වෙන්නේ වැර ගැන්වූ කොන් නමින්.


## රුපියල් 5000 ක නෝට්ටුවක්

ශ්‍රී ලංකා මහ බැංකුවේ 11 **වැනි මුදල් නෝට්ටු කාණ්ඩය** නිකුත් කළේ 2011 වර්ෂයේ. එහි තේමාව වුණේ සංවර්ධනය, සෞභාග්‍යය සහ ශ්‍රී ලංකාවේ නැටුම් ශිල්පීන් යන්න යි. මෙම කාණ්ඩයට රුපියල් 20, 50, 100, 500, 1000 සහ 5000 වටිනාකම් සහිත නෝට්ටු ඇතුළත් වුණා. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව රුපියල් 5000 වටිනාකම සහිත මුදල් නෝට්ටුවක් ප්‍රථම වරට නිකුත් කරන ලද්දේ 2011 වසරේ යි.

## 11 වන මුදල් නෝට්ටු කාණ්ඩයේ ඇතුළත් රූ සටහන්

### රුපියල් 20





මුහුණත - කොළඹ වරායේ වර්තමාන දර්ශනයක්, කොළඹ වරායේ පැරණි දර්ශනයක්, ශ්‍රී ලංකා පඬුකන් බස්සා (පඬුවන් බස්සා), නිල්ගල සමනළයා

පසුපස - උඩරට නැටුම් සම්ප්‍රදායට අයත් වෙස් නැටුම් ශිල්පියෙක්, ගැටබෙර වාදන ශිල්පියෙක්, පුන්කලස සහිත මුරගලක්, තනි ලියවැලක්

### රුපියල් 50






මුහුණත - මනම්පිටියේ ඉදිකළ නව පාලම, දුම්රිය මාර්ගය හා එක්ව ගමන් කරන්නා වූ පැරණි පාලම, දෙමෝදර ආරුක්කු නවයේ පාලම, ශ්‍රී ලංකා අනු මැසිමාරා, පිටනිල් කොළයා නමැති සමනළයා.

පසුපස - පහතරට නැටුම් සම්ප්‍රදායට අයත් වඩිග පටුන නැටුමේ යෙදෙන ශිල්පියෙක්, යක් බෙර වාදන ශිල්පියෙක්, පුන් කලස සහිත මුරගලක්, තනි ලියවැලක්

### රුපියල් 100

මුහුණත - නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය, පසුබිමින් විදුලි රැහැන් සමඟින් දිස්වන ලක්ෂපාන දිය ඇල්ල, ශ්‍රී ලංකාවේ රතු දෙමලිච්චා, සරා කොළයා නමැති සමනළයා




පසුපස - ඉන්දීය ශාස්ත්‍රීය සම්ප්‍රදායට අයත් භරත නැටුමේ යෙදෙන ශිල්පිනියක්, මෘදංග බෙර වාදන ශිල්පියෙක්, නාගරාජ මුරගලක් සහ ද්විත්ව ලියවැලක්.

## රුපියල් 500







මුහුණත - කොළඹ නගරයේ පිහිටි ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය හා ලංකා බැංකු මූලස්ථානය, මහනුවර ලංකාතිලක විහාරය, ශ්‍රී ලංකා අළු ගිරවා, හෙළ නීල පරමයා නමැති සමනළයා

පසුපස - පහතරට දෙවොල් මඩු නැටුම් සම්ප්‍රදායට අයත් තෙල්මේ නැටුමේ යෙදෙන ශිල්පියෙක්, යක් බෙර වාදන ශිල්පියෙක්, පද්මනිධි මුරගලක්, ද්විත්ව ලියවැලක්

## රුපියල් 1000







මුහුණත - ගම්පොළ-නුවරඑළිය මාර්ගයේ අලුතින් ඉදි වූ රම්බොඩ උමග, එම ස්ථානයේ වූ පැරණි රම්බොඩ දුර්ගය, ශ්‍රී ලංකා හිරා මලිත්තා, සිතිරි සිව්වා නමැති සමනළයා.

පසුපස - සබරගමුව නැටුම් සම්ප්‍රදායට අයත් මල්පදය නැටුමේ යෙදෙන ශිල්පියෙක්, දවුල් බෙර වාදන ශිල්පියෙක්, බහිරව රූප සහ දිසා පාලක රූප සහිත මුරගලක්, ද්විත්ව ලියවැලක්

## රුපියල් 5000







මුහුණත - වෙහෙරගල වේල්ලේ දර්ශනයක්, කැනියොන් වේල්ලේ දර්ශනයක්, ශ්‍රී ලංකා කහ කන් කොණ්ඩයෙක් (ගුරු කොණ්ඩයෙක්), දෙහි සැරියා නමැති සමනළයා

පසුපස - නාග රාක්ෂ නැටුමේ යෙදෙන ශිල්පියෙක්, ගුරුළු රාක්ෂ නැටුමේ යෙදෙන ශිල්පියෙක්, රත්න ප්‍රාසාදය මුරගල, කල්ප වෘක්ෂ ලියවැල් මෝස්තරයක්

## ආරක්ෂණ සලකුණු තවත් තර කෙරෙයි

2011 නව මුදල් නෝට්ටු කාණ්ඩය මඟින් නෝට්ටු සඳහා යොදන ආරක්ෂණ සලකුණු තව දුරටත් වැඩි දියුණු කිරීමට පියවර ගෙන තිබෙනවා.

### කඩදාසිය

සියලු ම නෝට්ටු නිෂ්පාදනය කර ඇත්තේ 100% ක් කපු මිශ්‍රිත පල්පයක් උපයෝගී කොට ගෙන සෑදූ කඩදාසිවලින්. මේ නිසා නෝට්ටුවලට සාමාන්‍ය කඩදාසිවලට වඩා තද ගතියක් ද රළු ගතියක් ද ලැබෙනවා. එමෙන් ම එය නෝට්ටුවල දිගුකල් පැවැත්මට ද හේතුවක්. මේ විශේෂ ලක්ෂණ නිසා සැබෑ මුදල් නෝට්ටුවක් ඇඟිලි තුඩුවලට දැනෙන ස්පර්ශය මගින් හඳුනාගත හැකියි. මෙම විශේෂිත කඩදාසි ඉතාමත් ම ආරක්ෂිත ආකාරයෙන් නිෂ්පාදනය කරන බැවින් එවැනි කඩදාසි සාමාන්‍ය වෙළෙඳපොළෙන් ලබාගත නොහැකියි.

### දිය සලකුණ





එක් එක් නෝට්ටුවේ මුහුණත එකිනෙකට වෙනස්වූ කුරුල්ලන්ගේ රූප දැක්වෙයි. ඒ ඒ නෝට්ටුවල දිය සලකුණ ලෙස දක්වා ඇත්තේ ද එම කුරුලු රූප ම යි. එමෙන් ම නෝට්ටුවේ වටිනාකම විශේෂිත දිය සලකුණක් ලෙසින් සිරස් අතට ඉලක්කම්වලින් දක්වා තිබෙනවා.

## ආරක්ෂණ නූල



රුපියල් 5000, 1000 සහ 500 නෝට්ටුවලට පිළිවෙලින් මිලි මීටර් 3, 2.5 හා 2 පළලින් යුතු වූ, රතු සහ කොළ ලෙස වර්ණය වෙනස්වන්නා වූ තැනින් තැන මතුවී පෙනෙන "ස්ටාර්ක්‍රෝම්" ආරක්ෂණ නූල යොදා තිබෙනවා. රුපියල් 20, 50 සහ 100 නෝට්ටුවල ආරක්ෂණ නූල සම්පූර්ණයෙන් ම නෝට්ටුව තුළට ම ඇතුළු කර ඇති අතර, නෝට්ටුවේ වටිනාකම හා CBSL යන අක්ෂර සමඟ එය අඛණ්ඩ ඉරක් ලෙස දිස්වෙයි.

## උස්වූ මුද්‍රිත



නෝට්ටුව ඇඟිලිතුඩුවලින් ස්පර්ශ කිරීමේදී උස්වූ මුද්‍රිත ප්‍රදේශ හඳුනා ගත හැකියි. නෝට්ටුවේ මුහුණත මහ බැංකුව නමැති පාඨය සහිත කොටස සහ නෝට්ටුව මධ්‍යයේ පිහිටි මෝස්තර, නෝට්ටුවේ පහළ කෙළවරේ නෝට්ටුවේ වටිනාකම දක්වා ඇති කොටස, නෝට්ටුවේ පිටුපස පහළ වටිනාකම දැක්වෙන ඉලක්කම් උස්වූ මුද්‍රිත ලෙසින් ඇතුළත් කර තිබෙනවා.

## විනිවිද පෙනෙන සලකුණ




නෝට්ටුව ආලෝකයට යොමු කොට බැලීමේ දී නෝට්ටුවේ මුහුණත වර්ණ දෙකකින් කඩින් කඩ දක්වා ඇති වටිනාකම සඳහන් ඉලක්කම් කොටස් (සමනළ රූපය අසල), නෝට්ටුවේ පිටුපස ඇති ඒ හා සමාන ඉලක්කම් කොටස් සමඟ එකිනෙකට සමපාත වී සම්පූර්ණ ඉලක්කම් සේ දිස්වේ.

## ඉතා කුඩා අක්ෂර



නෝට්ටුවේ සමනළ රූපයට පහළ කොටස් දෙස සමීපව බැලූවිට ඉතා කුඩා ලෙස මුද්‍රිත "CBSL" යන අක්ෂර සහ නෝට්ටුවේ වටිනාකම ඉලක්කමින් දැකිය හැකි යි.

## දෘෂ්‍යාබාධිත පුද්ගලයන් වෙනුවෙන් යොදා ඇති සලකුණ



දෘෂ්‍යාබාධිත පුද්ගලයන්ට නෝට්ටුවල වටිනාකම හඳුනාගැනීමට හැකි වන පරිදි නෝට්ටුවේ වම්පස සිරස් අතට රළු මුද්‍රිත තිත් (රු. 20 නෝට්ටුවේ එක් තිතක්) නෝට්ටුවේ වටිනාකම අනුව වැඩිවෙමින් යන ආකාරයට මුද්‍රණය කර තිබෙනවා.

## වර්ණ ගන්වන ලද සිහින් කෙඳි



කඩදාසි නිෂ්පාදනය කරනු ලබන අවස්ථාවේ දී ම කඩදාසියට ඇතුල් කරනු ලබන රතු, කොළ සහ නිල් පැහැයෙන් යුත් මිලි මීටර් 4 ක පමණ දිගින් යුත් ඉතා සිහින් කෙඳි කොටස් තවත් විශේෂිත ආරක්ෂණ සලකුණක්. මෙම කෙඳි පියවි ඇසට දැකිය හැකි වන අතර පාර ජම්බූල කිරණ ආලෝකය හමුවේ ප්‍රතිදීපනය වෙයි. මෙම ආරක්ෂණ සලකුණ මහ බැංකුව විසින් නෝට්ටුවලට හඳුන්වා දෙන ලද නව ආරක්ෂණ සලකුණක්. එය නව නෝට්ටු කාණ්ඩයේ සියලු ම නෝට්ටුවල දක්නට තිබෙනවා. එමෙන් ම ඉහළ අගයක් සහිත නෝට්ටුවල මේවා වැඩි ප්‍රමාණවලින් දක්නට හැකියි.

## වැර ගැන්වූ කොන්



“වැර ගැන්වූ කොන්” නමැති දිය සලකුණ එක් එක් නෝට්ටුවේ කොන් හතරේ විකර්ණ ආකාරයෙන් දිවෙන්නා වූ ඉරි ලෙසින් දැක්වෙයි.

## ප්‍රතිදීප්ත (ෆ්ලොරසන්ට්) මුද්‍රණ



මෙය ෆ්ලොරසන්ට් තීන්ත මගින් විශේෂිත මුද්‍රණයක් ලෙසින් නෝට්ටුවලට ඇතුළත් කරන ලද ආරක්ෂණ සලකුණක්. එහි පාර ජම්බූල කිරණ ආලෝකය හමුවේ ප්‍රතිදීපනය වෙයි. සියලු ම නෝට්ටුවල එම නෝට්ටුවේ වටිනාකම කොටුවක් තුළ ෆ්ලොරසන්ට් තීන්තවලින් මුද්‍රාපිතයි. රුපියල් 5000 නෝට්ටුවේ යොදා ඇත්තේ “ජෙමිනි ” නමැති රතු පැහැයෙන් දිස්වන ෆ්ලොරසන්ට් මුද්‍රණයක්.

කෙතෙක් ආරක්ෂණ පියවර තර කළ ද දිවයින පුරා නොයෙක් විට තැනින් තැන හොර නෝට්ටු මුද්‍රණය කර බෙදා හැරීම් පිළිබඳව හෙළිදරව් වෙයි. එහෙත්;

- හොර නෝට්ටුවක් තැනීම හෝ එවැනි ක්‍රියාවලියක කුමන කොටසක් හෝ දැනුවත් ව සිදුකිරීම.
- හොර නෝට්ටුවක් බව දැනුවත්ව හෝ හොර නෝට්ටුවක් බවට පිළිගත හැකි හේතු තිබිය දී, හොර නෝට්ටුවක් මිලදී ගැනීම, විකිණීම, හුවමාරු කිරීම හෝ එය සැබෑ නෝට්ටුවක් ලෙස භාවිත කිරීම.
- හොර නෝට්ටුවක් බව දැනුවත් ව එය සැබෑ නෝට්ටුවක් සේ භාවිත කිරීමේ අදහසින් තමා සන්තකයේ තබාගැනීම.
- හොර නෝට්ටුවක් තැනීම සඳහා යම් යන්ත්‍රයක්, උපකරණයක්, ද්‍රව්‍යයක් හෝ වෙනත් ඕනෑ ම මෙවලමක් සැපයීම, විකිණීම, මිලදී ගැනීම, ලබාදීම, එවැනි උපකරණයක් සන්තකයේ තබා ගැනීම හෝ එවැනි කටයුත්තකට කුමන ආකාරයකින් හෝ උදව් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක්!

එවන් කටයුත්තක් සම්බන්ධයෙන් වැරදිකරු වන්නෙකුට දණ්ඩ නීති සංග්‍රහයේ අංක 478 A සහ D විධිවිධාන යටතේ වසර 20 ක් දක්වා වන සිර දඬුවමකට හෝ දඩයකට හෝ ඒ දඬුවම් දෙකට ම හෝ යටත් විය හැකියි.

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 49 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකාව තුළ ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කිරීමේ අධිකාරිමය බලය පැවරී ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවට. පනතේ 50 වැනි වගන්තිය යටතේ වෙනත් කිසිදු අයෙකු විසින් මුදල් නිකුත් කිරීම සපුරා තහනම් වෙයි.

හොර නෝට්ටුවක් යැයි සැක කළ හැකි නෝට්ටුවක් ඔබේ අතට පත්වුවහොත්;

- සැබෑ නෝට්ටුවක් සමඟ එය සසඳා බලන්න.
- සැබෑ නෝට්ටුවල දක්නට ලැබෙන ආරක්ෂණ සලකුණු සැක සහිත නෝට්ටුවේ තිබෙනවාද?
- සැක සහිත නෝට්ටුව හැකි පමණ ඉක්මනින් මාරු කිරීමට, වෙන අයෙකු අතට පත්කිරීමට උත්සුක වෙන්න එපා.
- නෝට්ටුව ඔබට ලැබුණු ආකාරයත් එහි වටිනාකම, අනුක්‍රමික අංකය ආදියත් සඳහන් කරන්න.
- එය ඔබට ලබාදුන් පුද්ගලයා පිළිබඳ හැඩරුව හෝ එම නෝට්ටුව අතට පත්වූ ස්ථානය, පුද්ගලයා පිළිබඳ දන්නා තොරතුරු ඇත්නම් එම විස්තර අමතකවීමට පළමු සටහන් කරන්න.
- නෝට්ටුව වැඩිපුර අතපතගෑම වැළැක්වීමට එය ලියුම් කවරයක බහාලන්න.
- ළඟම ඇති පොලීසියට එම නෝට්ටුව සහ ඔබ සොයාගත් විස්තර සහ තොරතුරු නොවළහා දැනුම් දෙන්න.

එය ඔබ විසින් ඉටුකළ යුතු සමාජ මෙහෙවරක්!

## සමරු කාසි හා නෝට්ටු

ජාතික හා අන්තර්ජාතික වැදගත්කමකින් යුත් සංවත්සර උත්සව හා සම්මේලන සැමරීමටත්, සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරන ලද ආයතන සහ පුද්ගලයින්ට ගරු කිරීමක් වශයෙනුත් ශ්‍රී ලංකා මහ බැංකුව වරින් වර සමරු නෝට්ටු හා කාසි නිකුත් කරනු ලබනවා. මෙම සමරු නෝට්ටු මුද්‍රණය කරන්නේත් සමරු කාසි ටංකනය කරන්නේත් එක් වරක් පමණ යි. එමෙන් ම ඒවා නිකුත් කරන්නේ සීමිත සංඛ්‍යාවක්.

විශේෂිත සිදුවීම් සැමරීමට නිෂ්පාදනය කරනු ලබන මේවා බොහෝවිට සංසරණයේ පවතින නෝට්ටු හා කාසිවලට වඩා සුවිශේෂී නිර්මාණයන්. සමරු කාසි හා නෝට්ටු එකතු කරන්නන් මෙන් ම නාණක විශේෂඥයින් මේවාට නෛසර්ගික වටිනාකමට වඩා වැඩි වටිනාකමක් ලබා දෙන්නේ එහි ඇති දුර්ලභත්වය නිසයි. විවිධ ප්‍රමාණවලින්, රන් හා රිදී වැනි වටිනාකමින් වැඩි ලෝහවලින් මෙන් ම අනෙකුත් ලෝහවලින් ද සමරු කාසි ටංකනය කර තිබෙනවා.

## පළමු සමරු කාසිය ශ්‍රී ලංකා මහ බැංකුවේ පළමු කාසිය ම ද?

ශ්‍රී ලංකා මහ බැංකුව 1957 වර්ෂයේ තම ප්‍රථම කාසි නිකුතුවේ දී කාසි 2 ක් නිකුත් කර තිබෙනවා. ඒවා සංසරණය සඳහා නිකුත් කළ සමරු කාසි, එදා සිට 2015 වසර දක්වා සමරු කාසි 61 ක් සහ සමරු නෝට්ටු 3 ක් නිකුත් කර තිබෙනවා. මේවා මඟින් විවිධ විශේෂ අවස්ථා සහ විශේෂ චරිත සිහිපත්කර තිබෙනවා.

## වර්ණවත් කාසියක්

පළමුවරට වර්ණ කීපයක සංකලනයකින් යුත් සමරු කාසියක් නිකුත් කළේ 2010 දෙසැම්බර් 15 දින යි. මුහුණත වටිනාකම රුපියල් 5000 ක් වූ එය නිකුත් කළේ ශ්‍රී ලංකා මහ බැංකුවේ 60 වැනි සංවත්සරය සැමරීමට.



## ප්‍රථම වතාවට සමරු නෝට්ටුවක්

ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රථම වතාවට සමරු නෝට්ටුවක් නිකුත් කළේ 1998 වර්ෂයේ. එය රුපියල් 200 ක වටිනාකමින් යුත් පොලිමර් නෝට්ටුවක්. එය නිකුත් කළේ ශ්‍රී ලංකාවේ 50 වැනි නිදහස් සංවත්සරය වෙනුවෙන්.







ශ්‍රී ලංකාවට සාමය හා සෞභාග්‍යය උදාවීම සැමරීමට 2009 වසරේ දී රුපියල් 1000 වටිනාකමින් යුත් සමරු නෝට්ටුවක් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළා.







පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීම වෙනුවෙන් 2013 වසරේ දී රුපියල් 500 වටිනාකමින් යුත් සමරු නෝට්ටුවක් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළා. මෙය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ තුන්වන සමරු නෝට්ටුවයි.






# එදා සිට අද දක්වා සමරු කාසි

**වර්ෂ 2500 බුද්ධ ජයන්තිය**
වටිනාකම රු.5, ලෝහය රිදී

වර්ෂය 1957



**වර්ෂ 2500 බුද්ධ ජයන්තිය**
වටිනාකම රුපියලයි, ලෝහය තඹ/නිකල්

වර්ෂය 1957



**දෙවැනි ලෝක ආහාර සම්මේලනය**
වටිනාකම රු.2, ලෝහය තඹ/නිකල්

වර්ෂය 1968



**නොබැඳි ජාතීන්ගේ පස් වැනි සමුළුව - කොළඹ**
වටිනාකම රු.5, ලෝහය නිකල්

වර්ෂය 1976



**නොබැඳි ජාතීන්ගේ පස් වැනි සමුළුව - කොළඹ**
වටිනාකම රු.2, ලෝහය තඹ/නිකල්

වර්ෂය 1976



**පළමුවන විධායක ජනාධිපති ජේ ආර් ජයවර්ධන මහතාගේ පදවි ප්‍රාප්තිය**
වටිනාකම රුපියලයි, ලෝහය තඹ/නිකල්

වර්ෂය 1978



**පළමුවන විධායක ජනාධිපති ජේ ආර් ජයවර්ධන මහතාගේ පදවි ප්‍රාප්තිය (හිමාකාර)**
වටිනාකම රුපියලයි, ලෝහය රන් (කැරට් 22)

වර්ෂය 1978



**සර්ව ජන ඡන්ද බලය ලැබීමේ 50 වැනි සංවත්සරය**
වටිනාකම රු.5, ලෝහය තඹ/නිකල්

වර්ෂය 1981



**මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය**
වටිනාකම රු.2, ලෝහය තඹ/නිකල්

වර්ෂය 1981



**ජගත් නිවාස වසර**
වටිනාකම රු.10, ලෝහය තඹ/නිකල්

වර්ෂය 1987



**ජගත් නිවාස වසර (හිමාකාර)**
වටිනාකම රු.10, ලෝහය තඹ/නිකල්

වර්ෂය 1987



**ශ්‍රී ලංකා මහ බැංකුවේ 40 වැනි සංවත්සරය**
වටිනාකම රු.500, ලෝහය රිදී
වර්ෂය 1990



**ශ්‍රී ලංකා මහ බැංකුවේ 40 වැනි සංවත්සරය (හිමාකාර)**
වටිනාකම රු.500, ලෝහය රිදී
වර්ෂය 1990



**5 වැනි දකුණු ආසියානු ක්‍රීඩා සම්මේලනය කොළඹ (හිමාකාර)**
වටිනාකම රු.500, ලෝහය රන් (කැරට් 12)
වර්ෂය 1991



**5 වැනි දකුණු ආසියානු ක්‍රීඩා සම්මේලනය කොළඹ (හිමාකාර)**
වටිනාකම රු.100, ලෝහය රිදී
වර්ෂය 1991



**විධායක ජනාධිපති ආර්.ප්‍රේමදාස මහතාගේ පදවි ප්‍රාප්තියේ තෙවැනි සංවත්සරය**
වටිනාකම රුපියලයි, ලෝහය තඹ/නිකල්
වර්ෂය 1992



**විධායක ජනාධිපති ආර් ප්‍රේමදාස මහතාගේ පදවි ප්‍රාප්තිය තෙවැනි සංවත්සරය (හිමාකාර)**
වටිනාකම රුපියලයි, ලෝහය තඹ/නිකල්
වර්ෂය 1992



**විධායක ජනාධිපති ආර් ප්‍රේමදාස මහතාගේ පදවි ප්‍රාප්තිය තෙවැනි සංවත්සරය (හිමාකාර)**
වටිනාකම රුපියලයි, ලෝහය රන් (කැරට් 22)
වර්ෂය 1992



**විධායක ජනාධිපති ආර් ප්‍රේමදාස මහතාගේ පදවි ප්‍රාප්තිය තෙවැනි සංවත්සරය (හිමාකාර)**
වටිනාකම රුපියලයි, ලෝහය රිදී
වර්ෂය 1992



**2300 අනුබුදු මිහිඳු ජයන්තිය (හිමාකාර)**
වටිනාකම රු.500, ලෝහය රිදී
වර්ෂය 1993



**ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 50 වැනි සංවත්සරය**
වටිනාකම රු.2, ලෝහය තඹ/නිකල්
වර්ෂය 1995



**එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 50 වැනි සංවත්සරය (හිමාකාර)**
වටිනාකම රු.5, ලෝහය නිකල්/පිත්තල

වර්ෂය 1995



වර්ෂය 1995

**එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 50 වැනි සංවත්සරය**
වටිනාකම රු.5, ලෝහය නිකල්/පිත්තල



**එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ 50 වැනි සංවත්සරය**
වටිනාකම රු.1, ලෝහය තඹ/නිකල්

වර්ෂය 1996



වර්ෂය 1998

**ශ්‍රී ලංකාවේ 50 වැනි නිදහස් සංවත්සරය (හිමාකාර)**
වටිනාකම රු.5000, ලෝහය රන් (කැරට් 22)



**ශ්‍රී ලංකාවේ 50 වැනි නිදහස් සංවත්සරය (හිමාකාර)**
වටිනාකම රු.1000, ලෝහය රිදී

වර්ෂය 1998



වර්ෂය 1998

**ශ්‍රී ලංකාවේ 50 වැනි නිදහස් සංවත්සරය**
වටිනාකම රු.10, ලෝහය ද්වි ලෝහ (පිටත වටය- තඹ සහ නිකල්, ඇතුළත - නිකල් සහ පිත්තල)



**1996 ලෝක ක්‍රිකට් කුසලානය දිනා ගැනීම (හිමාකාර)**
වටිනාකම රු.1000, ලෝහය රිදී

වර්ෂය 1999



වර්ෂය 1999

**1996 ලෝක ක්‍රිකට් කුසලානය දිනා ගැනීම**
වටිනාකම රු.5, ලෝහය නිකල්/පිත්තල



**ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 50 වැනි සංවත්සරය (හිමාකාර)**, වටිනාකම රුපියලයි, ලෝහය නිකල් ආලේපිත වානේ

වර්ෂය 1999



වර්ෂය 1999

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 50 වැනි සංවත්සරය**
වටිනාකම රුපියලයි,
ලෝහය නිකල් ආලේපිත වානේ



**ශ්‍රී ලංකා මහ බැංකුවේ 50 වැනි සංවත්සරය (හිමාකාර)**
වටිනාකම රු.1000, ලෝහය රිදී
වර්ෂය 2000



**ශ්‍රී ලංකා නාවික හමුදාවේ 50 වැනි සංවත්සරය (හිමාකාර)**
වටිනාකම රුපියලයි, ලෝහය තඹ/නිකල්
වර්ෂය 2000



**ශ්‍රී ලංකා නාවික හමුදාවේ 50 වැනි සංවත්සරය**
වටිනාකම රුපියලයි,
ලෝහය නිකල් ආලේපිත වානේ
වර්ෂය 2000



**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 50 වැනි සංවත්සරය (හිමාකාර)**
වටිනාකම රුපියලයි, ලෝහය තඹ/නිකල්
වර්ෂය 2001



**කොළඹ ක්‍රමය 50 වැනි සංවත්සරය**
වටිනාකම රු.2, ලෝහය තඹ/නිකල්
වර්ෂය 2001



**ශ්‍යාමෝපසම්පදාවේ 250 වැනි සංවත්සරය (ප්‍රවර උපාලි නාහිමි)**
වටිනාකම රු.5, ලෝහය නිකල්/පිත්තල
වර්ෂය 2003



**ශ්‍යාමෝපසම්පදාවේ 250 වැනි සංවත්සරය (වැලිවිට ශ්‍රී සරණංකර සඟරාජ මාහිමි)**
වටිනාකම රු.5, ලෝහය නිකල්/පිත්තල
වර්ෂය 2003



**බුද්ධ පරිනිර්වාණයෙන් 2550 වැනි සංවත්සරය (හිමාකාර),** වටිනාකම රු.2000,
ලෝහය රිදී (කොටසක් රන් ආලේපිත)
වර්ෂය 2006



**බුද්ධ පරිනිර්වාණයෙන් 2550 වැනි සංවත්සරය (හිමාකාර)**
වටිනාකම රු.1500, ලෝහය රිදී
වර්ෂය 2006



**බුද්ධ පරිනිර්වාණයෙන් 2550 වැනි සංවත්සරය**
වටිනාකම රු.5,
ලෝහය පිත්තල ආලේපිත වානේ
වර්ෂය 2006



වර්ෂය 2007

**ලෝක කුසලාන ක්‍රිකට් (අනුශූරතාව)**
වටිනාකම රු.1000,
ලෝහය නිකල් ආලේපිත වානේ



වර්ෂය 2007

**ලෝක කුසලාන ක්‍රිකට් (අනුශූරතාව)**
වටිනාකම රු.5,
ලෝහය පිත්තල ආලේපිත වානේ



වර්ෂය 2008

**අර්ථසාධක අරමුදලේ 50 වැනි සංවත්සරය (හිමාකාර)**, වටිනාකම රු.1000,
ලෝහය නිකල් ආලේපිත වානේ



වර්ෂය 2008

**අර්ථසාධක අරමුදලේ 50 වැනි සංවත්සරය**
වටිනාකම රු.1000,
ලෝහය නිකල් ආලේපිත වානේ



වර්ෂය 2008

**අර්ථසාධක අරමුදලේ 50 වැනි සංවත්සරය**
වටිනාකම රු.2,
ලෝහය නිකල් ආලේපිත වානේ



වර්ෂය 2009

**ශ්‍රී ලංකා රේගුවේ ද්විශත සංවත්සරය (හිමාකාර)**,
වටිනාකම රු.200, ලෝහය රිදී



වර්ෂය 2009

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 60 වැනි සංවත්සරය**
වටිනාකම රු.1000, ලෝහය රිදී



වර්ෂය 2009

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 60 වැනි සංවත්සරය**
වටිනාකම රු.1000, ලෝහය තඹ/නිකල්



වර්ෂය 2010

**ශ්‍රී ලංකා මහ බැංකුවේ 60 වැනි සංවත්සරය (හිමාකාර)**,
වටිනාකම රු.5000, ලෝහය රිදී



වර්ෂය 2011

**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 60 වැනි සංවත්සරය**
වටිනාකම රු.2,
ලෝහය නිකල් ආලේපිත වානේ



**2600 සම්බුද්ධත්ව ජයන්තිය (හිමාකාර)**
වටිනාකම රු.1000, ලෝහය රිදී

වර්ෂය 2011



**2600 සම්බුද්ධත්ව ජයන්තිය**
වටිනාකම රු.10, ලෝහය නිකල් ආලේපිත වානේ

වර්ෂය 2011



**මහජන බැංකුවේ 50 වැනි සංවත්සරය (හිමාකාර)** වටිනාකම රු.1000, ලෝහය කොටසක් රන් ආලේපිත රිදී

වර්ෂය 2011



**කොළඹ ආනන්ද විද්‍යාලයේ 125 වැනි සංවත්සරය (හිමාකාර)**
වටිනාකම රු.2000, ලෝහය රිදී

වර්ෂය 2011



**ශ්‍රී ලංකා බාලදක්ෂ ව්‍යාපාරයේ ශත සංවත්සරය,** වටිනාකම රු.2, ලෝහය නිකල් ආලේපිත වානේ

වර්ෂය 2012



**ශ්‍රී ලංකා - ජපාන රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවට 60 වසරක් සපිරීම (හිමාකාර)**
වටිනාකම රු.1000, ලෝහය රිදී

වර්ෂය 2012



**ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ 150 වැනි ජන්ම සංවත්සරය (හිමාකාර)**
වටිනාකම රු.500, ලෝහය රිදී

වර්ෂය 2014



**ලංකා බැංකුවේ 75 වැනි සංවත්සරය**
වටිනාකම රු.5,
ලෝහය පිත්තල ආලේපිත වානේ

වර්ෂය 2014



**ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප් වහන්සේගේ ශ්‍රී ලංකා සම්ප්‍රාප්තිය (හිමාකාර)**
වටිනාකම රු.500, ලෝහය රිදී

වර්ෂය 2015



**කොළඹ මහ නගර සභාවේ 150 වැනි සංවත්සරය (හිමාකාර)**
වටිනාකම රු.500, ලෝහය රිදී

වර්ෂය 2015



# ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක 25 පිළිබිඹු කෙරෙමින් නිකුත් කරන ලද රු. 10/- නව කාසි කාණ්ඩය

වර්ෂ 2014 දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක 25 පිළිබිඹු කරමින් රුපියල් 10 වටිනාකමින් යුතු නව කාසි කාණ්ඩයක් නිකුත් කළා. මෙහිදී ශ්‍රී ලංකාවේ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කවලට අනන්‍ය වූ ලක්ෂණ මෙන්ම ඒ ඒ දිස්ත්‍රික්කයන්ට විශේෂිත වූ ස්ථාන සහ කරුණු නිරූපණය වුණා. මෙම කාණ්ඩය යටතේ පළමු කාසි නිකුතුව සිදු කරන ලද්දේ වර්ෂ 2014 නොවැම්බර් මස 17 වන දින යි.

මෙම ජාතික වැදගත්කමකින් යුතු අවස්ථාවට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය චිත්‍ර ශිල්පීන් වෙනුවෙන් දීප ව්‍යාප්ත තරගයක් පැවැත්වූවා. එහි දී තෝරා ගන්නා ලද නිර්මාණ ඇසුරෙන්, රුපියල් 10 වටිනාකමකින් යුතුව මල නොබැඳෙන වානේ ලෝහයෙන් මෙම කාසි ටංකනය කළේ ස්ලෝවැකියානු ටංකන සමාගමක් වන "මින්කොව්නා ක්‍රෙම්නිකා" විසින්.

## රුපියල් 10 නව කාසි කාණ්ඩයට අයත් කාසිවල මුහුණත රූ සටහන්.




### අම්පාර දිස්ත්‍රික් කාසිය

ගල්ඔය ව්‍යාපාරය යටතේ ඉදිකළ සේනානායක සමුද්‍රය සහ එය ඉස්මත්තේ ඉදිකර ඇති මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මහතාගේ පිළිරුව.

### අනුරාධපුර දිස්ත්‍රික් කාසිය

ජයශ්‍රී මහා බෝධිය සහ පෞරාණික අනුරාධපුර රාජධානියේ නෂ්ටාවශේෂ.







### බදුල්ල දිස්ත්‍රික් කාසිය

දර්ශණීය ලෙස ඇද හැලෙන දුන්හිඳ ඇල්ල.



**මඩකලපුව දිස්ත්‍රික් කාසිය**

පාසිකුඩා සංචාරක කලාපය සහ ජනප්‍රවාදයේ එන ගී කියන මාළුවන්.



**කොළඹ දිස්ත්‍රික් කාසිය**

ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, ලංකා බැංකු මූලස්ථානය, නෙළුම් පොකුණ රංග ශාලාව සහ කොළඹ වරාය.



**ගාල්ල දිස්ත්‍රික් කාසිය**

ලන්දේසි කොටුව, ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය සහ ගාල්ල මධ්‍යම බස් නැවතුම.



**ගම්පහ දිස්ත්‍රික්කය**

කැළණි විහාරය.



**හම්බන්තොට දිස්ත්‍රික් කාසිය**

මත්තල ගුවන්තොටුපල සමඟ මාගම්පුර වරාය.



**යාපනය දිස්ත්‍රික් කාසිය**

ඓතිහාසික නල්ලූර් කෝවිල.



**කළුතර දිස්ත්‍රික් කාසිය**

කළුතර හා බැඳුණු ප්‍රසිද්ධ පළතුරක් වන මැංගුස් සහ තවත් එළවළු වර්ග කීපයක්.



**මහනුවර දිස්ත්‍රික් කාසිය**

පූජනීය දළදා මාලිගාව.



**කෑගල්ල දිස්ත්‍රික් කාසිය**

පින්නවල අලි අනාථාගාරය.



**කිළිනොච්චි දිස්ත්‍රික් කාසිය**

එම ප්‍රදේශයට විශේෂ වූ "කොම්පරායි" නමින් හැඳින්වෙන වී බිස්ස.



**කුරුණෑගල දිස්ත්‍රික් කාසිය**

ඇතාගල සහ නගර මධ්‍යයේ ඇති ඔරලෝසු කණුව.



**මන්නාරම දිස්ත්‍රික් කාසිය**

මඩු පල්ලිය.



**මාතලේ දිස්ත්‍රික් කාසිය**

සීගිරි බිතුසිතුවම් පසුබිමෙහි සීගිරි පර්වතය.



**මාතර දිස්ත්‍රික් කාසිය**

දෙවුන්දර ප්‍රදීපාගාරය.



**මොනරාගල දිස්ත්‍රික් කාසිය**

කිරි වෙහෙර, රුහුණු මහා කතරගම දේවාලය සහ අලංකාර මොනර රුවක්.



**මුලතිව් දිස්ත්‍රික් කාසිය**

ධීවර කර්මාන්තයෙහි යෙදෙන ට්‍රෝලර් යාත්‍රාවක්.

**නුවරඑළිය දිස්ත්‍රික් කාසිය**

කඳුකරයේ තේ දළු නෙළන කාන්තාවක්.





**පොළොන්නරුව දිස්ත්‍රික් කාසිය**

පරාක්‍රම සමුද්‍රය පසුබිම් කරගත් පළමුවන පරාක්‍රමබාහු රජුගේ යැයි සැලකෙන පිළිරුව.

**පුත්තලම දිස්ත්‍රික් කාසිය**

දිවියෙක් සහ ඩොල්ෆින් මාළුවෝ.





**රත්නපුර දිස්ත්‍රික් කාසිය**

ශ්‍රීපාදස්ථානය සහ මැණික්.



**ත්‍රිකුණාමල දිස්ත්‍රික් කාසිය**

පූජනීය කෝනේෂ්වරම් කෝවිල, සේරුවාවිල රාජ මහා විහාරය සහ මුස්ලිම් පල්ලියක්.



**වව්නියාව දිස්ත්‍රික් කාසිය**

කුඹුරු යායක් සහ එළවළු.

## ශ්‍රී ලංකා සමරු කාසි හා නෝට්ටු ගැන තවදුරටත්...

1950 අගෝස්තු මස 28 වන දින ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාපනය කිරීමත් සමග ශ්‍රී ලංකාව තුළ ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කිරීමේ අධිකාරිමය බලය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරිණි. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංසරණයට අවශ්‍ය කාසි සහ නෝට්ටු නිකුත් කරනු ලබයි. රට අමතරව ජාතික හා අන්තර්ජාතික වැදගත්කමින් යුත් සංවත්සර හා සම්මේලන වැනි විවිධ අවස්ථාවන් හා සුවිශේෂී කාර්යභාරයන් ඉටුකරන ලද ආයතන හා පුද්ගලයින් සිහිකිරීම වෙනුවෙන් සමරු කාසි හෝ සමරු නෝට්ටු ද නිකුත් කරනු ලබයි. සමරු කාසියක් හෝ නෝට්ටුවක් නිකුත් කරනු ලබන විට එය (දේශීය හෝ විදේශීය) සමාජයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරන අවස්ථාවක් වීම හෝ සමාජයේ සුභසිද්ධිය සඳහා වැදගත් අවස්ථාවක් වීම හෝ පුද්ගලයෙක් සම්බන්ධයෙන් නම් එම පුද්ගලයා සමාජයේ සුභසිද්ධිය උදෙසා වැදගත් මෙහෙයක් ඉටු කළ අයෙක් වීම ආදී කරුණු සළකා බැලේ.

සමරු කාසි විවිධ වටිනාකම්වලින්, විවිධ හැඩවලින්, විවිධ ප්‍රමාණවලින් සහ විවිධ ලෝහ වලින් පහත සඳහන් ආකාරවලින් ටංකනය (නිෂ්පාදනය) කරනු ලබයි.

1. කාසියේ පසුතලය කැඩපතක ඔපය ගෙන දෙන අයුරින් සහ කාසියේ අඩංගු සලකුණු සහ මුද්‍රණ හිම මෙන් සුදු පැහැ ගන්වා කැපී පෙනෙන අයුරින් ටංකනය කිරීම. මේවා හිමාකාරයෙන් ටංකිත කාසි (Frosted Proof Coins) ලෙස හඳුන්වයි.

2. කාසියේ පසුතලය සහ මෝස්තරය කැඩපතක ඔපය ගෙන දෙන අයුරින් ටංකනය කිරීම (Brilliant Uncirculated Condition). මේවා සංසරණයට පත් නොකළ දීප්තිමත් කාසි ලෙස හඳුන්වයි.

3. සාමාන්‍ය සංසරණයට නිකුත් කරනු ලබන කාසිවලට සමාන ආකාරයෙන් විශේෂ ඔප දැමීම් රහිතව ටංකනය කිරීම.

එක් එක් අවස්ථාවන් වෙනුවෙන් නිකුත් කරනු ලබන සමරු කාසි හෝ නෝට්ටු ඉතා සීමිත සංඛ්‍යාවකින් නිකුත් කරනු ලබයි. ඉහත 1 සහ 2 යටතේ සංසරණය සඳහා නිකුත් කරනු ලබන විශේෂ සමරු කාසි, අලංකාර ඇසුරුම්වල බහා මුහුණත වටිනාකමට වඩා වැඩි මිලකට අලෙවි කරනු ලබයි. ඒ සඳහා මුදල් නීති පනතේ අංක 52 'අ' වගන්තියේ (1) 'අ' සහ 'ආ' යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවට බලය පැවරී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රථම වරට සමරු කාසියක් නිකුත් කරණු ලැබුවේ 1957 වර්ෂයේ දී ය. එනම් බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු 2500ක් සැමරීම නිමිත්තෙනි. එතැන් පටන් වර්ෂ 2015 දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවස්ථාවන් 40 කදී සමරු කාසි 64 ක් හා සමරු නෝට්ටු 3 ක් නිකුත් කර ඇත.

## නෝට්ටු මුද්‍රණය හා කාසි ටංකනය - ඉතිහාසයෙන් බිඳක්

ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවීමට පෙර පැවති මුදල් කොමසාරිස් මණ්ඩලය යටතේ නෝට්ටු මුද්‍රණය කරනු ලැබුවේ එංගලන්තයේ තෝමස් ඩී ලා රූ සහ සමාගම විසින්. දෙවැනි ලෝක යුද්ධයේ ආරම්භයත් සමඟ ම මෙය ඉන්දීය රාජ්‍ය ආරක්ෂණ මුද්‍රණාලයට පැවරුණා. මෙම යුධ කාල වකවානුවේ දී ලංකා රාජ්‍ය මුද්‍රණාලය ද හදිසි අවස්ථා සඳහා මුදල් නෝට්ටු මුද්‍රණය කර තිබෙනවා.

ශ්‍රී ලංකා මහ බැංකුවේ පළමු මුදල් නෝට්ටු කාණ්ඩය මුද්‍රණය කරන ලද්දේ බ්‍රිතාන්‍යයේ බ්‍රැඩ්බරි විල්කින්සන් සහ සමාගම විසින්. නො කඩවා සැලකිය යුතු කාලසීමාවක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් නෝට්ටු මුද්‍රණය සඳහා මෙම සමාගම තෝරා ගැනුනා.

1983 වර්ෂයේ දී එක්සත් රාජධානියේ බ්‍රැඩ්බරි විල්කින්සන් පී.එල්.සී. සමාගම හා ශ්‍රී ලංකා රජය අතර ඒකාබද්ධ ආරක්ෂිත මුද්‍රණ ව්‍යාපාරයක් ස්ථාපිත වුණා. එය හැඳින්වුණේ බ්‍රැඩ්බරි විල්කින්සන් ලංකා පුද්ගලික සමාගම නමින්. මෙම සමාගම 1987 දී බියගම අපනයන සැකසුම් කලාපයේ දී මුද්‍රණ කටයුතු ආරම්භ කළා. එය ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා මුදල් නෝට්ටු මුද්‍රණය ආරම්භ කළේ 1988 වසරේ, ඓතිහාසික හා සංවර්ධනාත්මක තේමා සහිත මුදල් නෝට්ටු කාණ්ඩයෙන්. එහෙත් 1998 රුපියල් 200 පොලිමර් සමරු නෝට්ටුව පමණක් මුද්‍රණය කරන ලද්දේ ඕස්ට්‍රේලියාවේ නෝට්ටු මුද්‍රණ සමාගම මගින්.

මේ අතරතුර 1986 දී එංගලන්තයේ තෝමස් ඩි ලා රූ සමාගම විසින් බ්‍රැඩ්බරි විල්කින්සන් ලංකා පුද්ගලික සමාගම පවරා ගත්තා. ඉන්පසු බ්‍රැඩ්බරි විල්කින්සන් ලංකා පුද්ගලික සමාගමේ නම 1990 දී තෝමස් ඩි ලා රූ ලංකා පුද්ගලික සමාගම ලෙස ද, 1998 දී ඩි ලා රූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් පුද්ගලික සමාගම ලෙස ද වෙනස් වුණා. එය කටයුතු කරන්නේ මුදල් නෝට්ටු මුද්‍රණයට වසර 150 ක ඉතිහාසයක් ඇති එක්සත් රාජධානියේ පිහිටි ප්‍රධාන සමාගම වන ඩි ලා රූ පී එල් සී සමාගම යටතේ යි.

මුදල් කොමසාරිස් මණ්ඩලය විසින් සිදු කළ පරිදි ම, 1957 වන තෙක් ම සංසරණය සඳහා වන කාසි අවශ්‍යතා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයාගනු ලැබුවේ බොම්බායේ සහ කල්කටාවේ පිහිටි ඉන්දියානු රාජ්‍ය ටංකන වෙතින්. එතැන් සිට මෙය සිදුකරනු ලැබුවේ මහා බ්‍රිතාන්‍ය රාජකීය ටංකනය මගින්. එහෙත් 1996 වසරේ දී සත 50 කාසි ටංකනය කරනු ලැබුවේ කැනඩාවේ රාජකීය ටංකනය මගින්. වසර 1000 ක ඉතිහාසයක් හෙබි මහා බ්‍රිතාන්‍ය රාජකීය ටංකනය, 2009 දෙසැම්බර් මස තෙක් ක්‍රියාත්මක වුණේ බ්‍රිතාන්‍ය මහ රැජිණගේ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවක් වශයෙන්. 2010 ජනවාරි මාසයෙන් පසුව එය සම්පූර්ණයෙන් ම රාජ්‍ය සමාගමක් වන රාජකීය ටංකන සමාගම බවට පරිවර්තනය වුණා.

## කාසි තියෙන්නේ පළඳින්නද?

රූපාලංකාරය සඳහා ආභරණ සෑදීමට ඇත්තේ දීර්ඝ ඉතිහාසයක්. හිසේ සිට පාදාන්තය දක්වා මෙසේ පළඳින ආභරණ රැසක් නොයෙකුත් සමාජවල දකින්න පුළුවන්. ශිලා යුගයේ මිනිසා පවා තම වටපිටාවෙන් සොයාගත හැකි සත්ව ඇට කැබලි, විවිධ හැඩයේ ගල්, ඇට වර්ග හා ලී කැබලි ආභරණ ලෙස සකසා ගත්තා. එසේ ස්වභාව ධර්මයෙන් ලබා ගත් සරල ආභරණ පසුකාලීනව රන්, රිදී වැනි වටිනා දුර්ලභ ලෝහ වර්ගවලින් සාදා මුතු, මැණික් ඔබ්බවා සෑදීමක් දක්වා පරිවර්තනය වී තිබෙනවා. එසේ කලින් කල ආභරණ සෑදීමට යොදා ගන්නා දෑ වෙනස් වී තිබෙනවා. එමෙන් ම තවදුරටත් වෙනස් වෙමින් පවතිනවා. ඒ අනුව නොවටිනා ප්ලාස්ටික් කැබලි, ගල් වර්ග ආදිය විවිධ හැඩයෙන් යුත් විසිතුරු ආභරණ බවට පරිවර්තනය වෙද්දී ගනුදෙනු සඳහා ම නිෂ්පාදනය කෙරුනු කාසිත් දිගු කලක සිට ආභරණ බවට පත්කරගෙන තිබෙන ආකාරය දැක ගන්න පුළුවන්. කාසි ඒවා පවතින ස්වරූපයෙන් වගේ ම ස්වරූපය මුළුමනින් ම වෙනස් කිරීමෙන් ද ආභරණ සෑදීමට යොදා ගෙන තිබෙන බව නොයෙක් අවස්ථාවල හෙළි වී තිබෙනවා. පැරණි කාසිවලින් සෑදූ හවඩි, මාල, කොණ්ඩ කූරු වැනි ආභරණ අදටත් අපට ඇතැම් අවස්ථාවල දැකගන්න පුළුවන්. ඉතාමත් ම පැරණි කාසි වගේ ම වර්තමානයේ භාවිතයට ගැනෙන ඇතැම් කාසිත් මෙසේ ආභරණ සෑදීමට යොදාගන්නා බවයි වාර්තා වෙන්නේ.

ඒත් මුදල් නීති පනත අනුව ශ්‍රී ලංකාවේ වලංගු කාසියක් උණු කිරීම, කැඩීම, සිදුරු කිරීම, විකල කිරීම හෝ නීත්‍යනුකූල ගනුදෙනු සඳහා හැර වෙනත් කිසි ම කටයුත්තක් සඳහා යොදා ගැනීම දඬුවම් ලැබිය හැකි වරදක්.



**වෙහෙසට එල සෑහෙයි ද?**

ශ්‍රී ලංකා මහ බැංකුව කාසි හා නෝට්ටු නිෂ්පාදනය කරන්නේ විශාල පිරිවැයක් දරමින්. ඒවා නිෂ්පාදනයට පමණක් සීමා නොවී දිනෙන් දින මුදල් නෝට්ටුවලට වැඩි දියුණු කරන ලද ආරක්ෂණ සලකුණු යොදන්නේ මහජනතාව සහ ආර්ථිකය හොර නෝට්ටු ජාවාරම්කරුවන්ගෙන් ගලවාගැනීමට යි. එහෙත් කෙතෙක් පියවර ගත්ත ද මහජනතාව නෝට්ටු පරිහරණය කරන ආකාරය ගැන සෑහීමකට පත්විය නොහැකි යි. නොවැළැක්විය හැකි හේතු නිසා මෙන් ම හිතාමතා ම විකෘති කරන ලද නෝට්ටු විශාල ප්‍රමාණයක් දිනපතා ම දිවයිනේ සතර දිග්භාගයෙන් මහ බැංකුව වෙත ගලා එන්නේ බොහෝ දුරට මුදල් නෝට්ටු භාවිතයේ ඇති නොසැලකිලිමත්කම නිසයි.


# කාසි නිකුතුව

## 2014 හා 2015 කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ කාසි




මහජනයාගෙන් ලැබෙන බොහෝ පැමිණිලි සැලකිල්ලට ගෙන, 2016 දී සියලු ම බලපත්‍රලාභී වාණිජ බැංකුවලට ප්‍රමාණවත් ලෙස කාසි නිකුත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව පියවර ගෙන ඇත.

# ගනුදෙනුවල කතන්දරේ....




... බාටර් ක්‍රමයේ මේ විදිහට ප්‍රශ්න මතු වෙන්න ගත්තා ම වැඩේ කෙරෙන විදිහක් හොයාගන්න සිද්ද වුණා නේ. ඉතිං ඒ හොයාගත්ත ක්‍රමයෙදිත් කළේ භාණ්ඩයකට භාණ්ඩයක් හුවමාරු කරන එකම යි. ඒත් ඒ කලින් විදිහට නෙවෙයි. එහිදී එක් භාණ්ඩ වර්ගයක් වටිනාකම මනින ඒකකයක්, හුවමාරු මාධ්‍යයක්, එහෙමත් නැත්නම් මුදලක් ලෙස ක්‍රියා කළා. ඒවා හැඳින්වුණේ භාණ්ඩ මුදල් කියලා.


ඒ අනුව ගවයන්, ඌරන්, කුකුළන් වැනි සත්තුත්, දුම්කොළ, ලුණු, හාල්, පොල් වැනි පරිභෝජන භාණ්ඩත් සිප්පිකටු, බෙලිකටු, විවිධ ගල් වර්ග, ඇට වර්ග ආදියත් ඒ විදිහට මුදල් ලෙස භාවිතයට ගැනුනා.

ඒත් කාලයක් යනකොට ඒ ක්‍රමයත් ඒ තරම් ම සාර්ථක වන බවක් පෙනුනේ නෑ. මුදල් ලෙස සැලකූ සමහරක් දේ කාලයක් තියාගන්න බැරි වුණා. තවත් සමහරක් දේ ඉතාමත් ම සුලභ වුණා. තමන්ගේ වටපිටාවෙන් ලේසියෙන් ම හොයාගන්න පුළුවන් දෙයක් ලබා ගන්න තමන්ට තියෙන වටින දෙයක් දෙන්න කවුද සතුටු වෙන්නෙ? ඉතින් මේ අඩුපාඩු මකා ගන්න ආයෙත් වැඩේ කෙරෙන විදිහක් හොයා ගන්න සිද්ධ වුණා.



... භාණ්ඩ මුදල් පිළිගැනීම ඒ විදියට මිනිස්සු ම ප්‍රතික්ෂේප කළාම ඒ වෙනුවට රත්තරන්, රිදී වගේ වටිනා කියන දුර්ලභ දෙයක් මුදල් විදිහට පිළිගන්න එක හොඳයි කියල සමාජයේ පිළිගැනීමක් ඇති වුණා. ඒ වගේ දෙයක් ඕන කෙනෙකුට ලේසියෙන් හොයා ගන්නත් බෑ. නිෂ්පාදනය කරන්නත් බෑ. ඒනිසා රත්තරන්, රිදී ගනුදෙනු කරන්න හොඳ මාර්ගයක් වුණා. අද අපි කාසි විදියට භාවිතා කරන මුදල්වල උත්පත්තියට පසුබිම හැදුනේ එහෙම යි.

ඒත් මේ හැම දෙයක් ම සිදු වුණේ දවසකින් දෙකකින් නෙවේ. සිය වස් ගණනාවක් තිස්සේ.




... රත්තරන් හා රිදී ගනුදෙනු සඳහා භාවිතයට ගැනීමේ ඉතිහාසය ක්‍රිස්තු පූර්ව 2000 තරම් ඈත කාලය දක්වා දිව යනවා. එය ආරම්භ වුණේ බැබිලෝනියාවෙන්. ඒත් මුලදී රන් හා රිදී ගනුදෙනු සඳහා යොදාගෙන තිබෙන්නේ අද අපි දකින ආකාරයේ කාසි ස්වරූපයෙන් නෙවේ. ඒවා කාසි බවට පෙරළුනේ ක්‍රිස්තු පූර්ව 620 සිට. එය කළේ බටහිර ආසියාවේ ඇනටෝලියානු අර්ධද්වීපයේ තිබෙන ලිඩියාවේ වැසියෝ. ඔවුන් කනක රජත කියන රන් හා රිදීවලින් සෑදුණු ස්වභාවික ලෝහයක් මුදල් ලෙස හැඩ ගස්වලා භාවිතයට ගන්න පටන් ගත්තා. ලෝකයේ කාසි ටංකනයේ පළමු වැනි අදියර තමයි ඒ. ඒ කාසියට නියමිත බරක් තිබුණා. රාජ්‍ය මුද්‍රාව තිබුණා. මේ කාසි ක්‍රිස්තු පූර්ව 550 පමණ වෙද්දී ලෝකයේ සතර දිග්බාගයේ සියලුම නගරවල භාවිතා කරන්න පටන් ගත්තා. ඒ රන් හා රිදී කාසි ලෙසින්.




... රන් හා රිදී කාසි භාවිතය සම්බන්ධයෙන් අපේ රටටත් තියෙන්නේ දිගු ඉතිහාසයක්. ක්‍රිස්තු පූර්ව 543 සිදුවූ විජයාගමනයටත් පෙර සිටම ලංකාවේ වෙළෙඳ ආර්ථිකයක් තිබුණු බවට ජාතක කතා හා පාළි අටුවා වැනි නොයෙකුත් මූලාශ්‍රවල සඳහන් වෙතත් එකල භාවිත කළ මුදල් වර්ග මොනවාද යන්න පිළිබඳ නිශ්චිතව ම සඳහන්ව නැහැ. විජය රජුගේ රාජ්‍ය කාලයේත් පණ්ඩුකාභය වැනි පැරණි ම රජවරුන්ගේ කාලවලත් මුදල් භාවිත කළ බවට නොයෙකුත් කතා පුවත් පාළි අටුවා, වංශ කතා සහ සහ සංදේශ කාව්‍යවල සඳහන්ව තිබෙනවා. ඒත් ඓතිහාසික ලංකාවේ කාසි භාවිතය පිළිබඳ නිශ්චිතව ම සඳහන් වෙන පළමුවන සෙල් ලිපිය අයත් වන්නේ ක්‍රි.පූ. 3 වැනි සිය වසට. මේ අවධිය අයත්වන්නේ අනුරාධපුර යුගයට.



... අනුරාධපුර යුගය ලංකා ආර්ථික ඉතිහාසයේ සුවිශේෂත ම අවධියක්. එය ඇරඹුනේ ක්‍රි.පූ. 437 දී පණ්ඩුකාභය කුමරු රජවීමත් සමඟ. වසර 70 ක් වූ ඔහුගේ පාලන කාලය තුළ නගර නිර්මාණ ශිල්පයේ හා වාපි කර්මාන්තයේ සුවිසල් දියුණුවක් ඇතිවුණා. එපමණක් නොවෙයි, එකල රටවටා ගංගා මෝය ආශ්‍රිතව වරාය සහ තොටුපොළ රැසක් ක්‍රියාත්මකව තිබුණා. ඒවා ජාත්‍යන්තර වෙළෙඳාම ඔස්සේ ලංකා ආර්ථිකය තුළ සුවිශේෂ කාර්යයක් ඉටුකර තිබෙනවා.



... ජාත්‍යන්තර වෙළෙඳාම සම්බන්ධයෙන් ලංකාව අතීතයේ දිනා තිබුණු කීර්ති නාමය දෙස් විදෙස් නොයෙකුත් වාර්තාවලින් තහවුරු වෙනවා. ඒවාට අනුව එකල මේ දිවයින මහා වෙළෙඳ මධ්‍යස්ථානයක්. ගොඩබිම් සේද මාර්ගය ඔස්සේ ගැල් මඟින් ඉන්දීය වරායවල් වෙත ගෙන ආ භාණ්ඩ නැව් මාර්ගයෙන් මහාතිත්ථයටත්, ගෝකණ්ණතිත්ථයටත් ගෙනැවිත් එතැන් සිට ගැල්වල පටවා අනුරාධපුර නගරයට ගෙන ගිය අතර මුහුදු සේද මාර්ගයේ මධ්‍යයේ පිහිටීම ද විදෙස් වෙළෙඳ නැව් අප රටට පැමිණීමට හේතුවී තිබෙනවා. විදේශිකයින්ගේ මෙවැනි වාර්තාවලින් සහ පුරා විද්‍යාත්මක සාක්ෂිවලින් පැහැදිලි වෙන්නේ එවකට අනුරාධපුරය ඉතා ඉසුරුමත් විසල් නගරයක් ව තිබූ බවයි. එය දේශීය වශයෙන් භාණ්ඩ බෙදාහැරීමේ මධ්‍යස්ථානයක් ලෙසත් අපනයනය සඳහා භාණ්ඩ සැකසූ ස්ථානයක් ලෙසත් කටයුතුකර තිබෙනවා. ඒ අනුව අද අප ප්‍රති අපනයන කටයුතු ලෙස හඳුන්වන ක්‍රියාවලිය මෙයට ශත වර්ෂාධික කාලයකටත් පෙර අප රටේ ක්‍රියාත්මක වී ඇති බවයි පැහැදිලි වෙන්නේ. ඒ අනුව එදත් අපේ ලක්බිම නාවුක මධ්‍යස්ථානයක් සහ ජාත්‍යන්තර වෙළෙඳපොළක් ලෙස ක්‍රියාත්මක වී තිබෙනවා.



... නාවුක මධ්‍යස්ථානයක් සහ ජාත්‍යන්තර වෙළෙඳපොළක් ලෙස ලංකාව ලොව හිමිකරගෙන සිටි ස්ථානය අනුරාධපුරය ආශ්‍රිත ව කෙරෙන පුරාවිද්‍යා කැණීම්වලින් පමණක් නොව දිවයිනේ නොයෙකුත් ප්‍රදේශවල කැනීම්වලින් සොයා ගැනීමට හැකිවී ඇති විදේශීය රටවල නිෂ්පාදිත, විශේෂයෙන් ම චීන සහ ග්‍රීක මැටි බඳුන් ද රෝම සහ වෙනත් විදේශීය කාසිවලින් ද සනාත කෙරෙනවා. එපමණක් නොවෙයි; ක්‍රිස්තු වර්ෂ 150 දී පමණ ජීවත් වූ ටොලමි විසින් අඳින ලද ලෝක සිතියම ද ලංකාවට එකල ලොව තිබුණු පිළිගැනීම කෙතෙක් ද යන්න පිළිබඳ සාක්ෂි දරනවා.




... ටොලමිගේ ලෝක සිතියම ඔහු ඇඳ ඇත්තේ ඉතාමත් ම නිවැරදි මාන සහ දිශානතීන්ගෙන් යුක්තව යි. ඒත් මධ්‍යධරණී ප්‍රදේශයත්, යුරෝපය සහ මැද පෙරදිගත් ඉතා ප්‍රශස්ත අයුරින් නිරූපණය කළ ටොලමි සිතියම තුළ ලංකාව දක්වා ඇත්තේ ඉතා විශාල ලෙස. ඒත් එය අහම්බයක් නොවේ. ඔහු ඉන් නිරූපණය කර තිබෙන්නේ භූමිය අයමින් සහ විතරින් කුඩා වුවත් ඔහු ජීවත්වූ කාලයටත් පෙර සිට ම සමස්ත ලෝකය තුළ ලක්දිව කෙරෙහි පැවති පිළිගැනීමයි. එහි වටිනාකමයි.

# මුදල් භාවිතයේ හොඳ පුරුදු
# නිවැරදි ලෙස මුදල් පරිහරණය කරමු

**නිශානි කරුණාරත්න**
සහකාර අධිකාරි
ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව

1949 අංක 58 දරන මුදල් නීති පනතට අනුව ශ්‍රී ලංකාවේ සංසරණයට අවශ්‍ය මුදල් නෝට්ටු හා කාසි නිකුත් කිරීමේ පරම අධිකාරීම බලය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත. මෙම නීතිමය අධිකාරීම බලය නිසා ගනුදෙනු හා බැඳුණු ගෙවීම් පියවීම් සඳහා භාවිත කරනු ලබන නෝට්ටු හා කාසි නීත්‍යනුකූලව පිළිගත් වලංගු මුදල් වේ. ගනුදෙනුවක දී කිසිදු පැකිලීමකින් තොරව අප මුදල් පිළිගනු ලබන්නේ එබැවිනි.

ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව මුදල් කළමනාකාරිත්වයේ කේන්ද්‍රස්ථානය ලෙස ආර්ථිකයේ අවශ්‍යතා සපුරාලීම සඳහා වාණිජ බැංකු පද්ධතිය හරහා නව මුදල් නෝට්ටු හා කාසි ආර්ථිකයට එකතු කරයි. එමෙන්ම වාණිජ බැංකු ශාඛා පද්ධතිය මගින් එම මුදල් ජනතාව අතරට බෙදා හැරීම, භාවිතයට සුදුසු මුදල් සංසරණයට එකතු කිරීම, සහ භාවිතයට නුසුදුසු මුදල් භාවිතයෙන් ඉවත් කිරීම යනාදිය සිදු කරනු ලබයි.

වියදමකින් තොරව කිසිවක් නොලැබෙන්නා සේ ම නෝට්ටු හා කාසි නිෂ්පාදනය සඳහාද පිරිවැයක් දරන්නට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදුවේ. වක්‍රාකාරව බැලුවහොත් මේ සඳහා යොදවන්නේ මහජනතාවගේ මුදල්ය. බොහෝ විට කාසි ටංකනය හා නෝට්ටු මුද්‍රණය කිරීම විදේශ සමාගම් මගින් සිදු කෙරේ. එම නිසා කාසි හා නෝට්ටු නිෂ්පාදන පිරිවැයෙහි සැලකිය යුතු ප්‍රමාණයක් විදේශ විනිමය වේ. වර්තමාන මුදල් නෝට්ටු මුද්‍රණකරු වන "ඩිලාරූ" ලංකා සමාගමේ කොටස් හිමිකාරීත්වයක් ශ්‍රී ලංකා රජයට තිබුනද ඊට අදාළ අමුද්‍රව්‍ය බොහොමයක් ආනයනය කිරීමට සිදුවීම නිසා සැලකිය යුතු විදේශ විනිමයක් පිටරටට ගලා යෑම සිදුවේ.

**මුදල්වල ආයු කාලය**

අප එදිනෙදා ජීවිතයේ ක්‍රියාකාරකම් සඳහා භාවිත කරන උපකරණ ආදිය සඳහා මෙන් ම නෝට්ටු හා කාසි සඳහා ද ආයු කාලයක් පවතී. මූලිකව ම මෙම කාලය රඳා පවතින්නේ කරුණු කීපයක් මත ය. එනම්,

- මුදල් නිපදවීම සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍යයන්හි ප්‍රමිතිය
- මුදල් නැවත, නැවත සංසරණය කෙරෙන වාර ගණන
- මුදල් භාවිත කරන පිළිවෙල හා
- ඒවා භාවිතයට යොදා ගනු ලබන්නේ කවර තත්ත්වයන් යටතේද යන්නයි.

ගනුදෙනු පහසු කරන අතරමැදියෙකු ලෙස මුදල් නෝට්ටු හා කාසි ක්‍රියා කරයි. එම නිසා නෝට්ටුවක් හෝ කාසියක් නිෂ්පාදනයෙන් පසු එය ඉතා දිගු කාලයක් පවත්වා ගැනීමට හා වැඩි ගනුදෙනු ප්‍රමාණයක් සිදු කිරීම සඳහා යොදා ගැනීමට නම් ඒවා විධිමත් ව භාවිත කිරීමට අප සැලකිලිමත් විය යුතු ය. මුදලේ සාමාන්‍ය ආයු කාලය වැඩිවීම තුලින් අලුතින් නිකුත් කිරීමට අවශ්‍ය නෝට්ටු හා කාසි ප්‍රමාණය අඩු කිරීමට මෙන් ම එම මුදල් නිකුත් කිරීමට වැය වන ජාතික පිරිවැය අඩු කිරීමට ද හැකි වේ.

**අවිධිමත් මුදල් භාවිතය**

මුදල් නෝට්ටු අවිධිමත් ලෙස පරිහරණය කරන ආකාර අපි සමාජයේ අත්විඳ ඇත්තෙමු. මෙය දෙයාකාරයකින් සිදුවේ. එනම්,

1. හිතාමතා මුදල් නෝට්ටු/කාසිවලට හානි සිදු කිරීම
2. නොසැලිකිලිමත් ලෙස පරිහරණය

1. හිතාමතා නෝට්ටුවලට හානි සිදු කිරීම
   - නෝට්ටු මත ඇඳීම, ලිවීම හෝ ඒ මත ඇති සලකුණු විකෘති කිරීම,
   - නෝට්ටු කැපීම, ඉරීම හෝ පිලිස්සීම ආදිය වේ.
2. නොසැලිකිලිමත් පරිහරණය
   - නෝට්ටු අධික තාපයට හෝ අධික ශීතලට නිරාවරණය කිරීම
   - නෝට්ටු නැවීම හෝ රෝල් කිරීම
   - ඉතා අපිරිසිදු දෑත්වලින් නෝට්ටු ස්පර්ශ කිරීම
   - නිවෙස්වල විවිධ ස්ථානවල නෝට්ටු සඟවා තැබීම ආදිය සමහරකි.

මහජනතාව විසින් මුදල් නෝට්ටු පරිහරණය කරන කිනම් හෝ අවිධිමත් ක්‍රමයක් නිසා ඒවායේ ගුණාත්මකභාවය ඉතා ඉක්මණින් හීන විමත් කල් පැවැත්ම අඩු වීමත් සිදුවේ. සමහර පුද්ගලයින් අධික කෝපයට පත් වූ අවස්ථාවලදී නෝට්ටු ඉරා දැමීම, පවා සිදු කරනු අප දැක ඇත. බස් කොන්දොස්තරවරුන් තමා වෙත ලැබෙන මුදල් නෝට්ටු නවා තමන්ගේ ඇඟිලිකරු මත රඳවා ගැනීම, වෙළෙඳුන් තම අපිරිසිදු දෑත්වලින් මුදල් නෝට්ටු පරිහරණය කිරීම ද අපි බොහෝ විට දැක ඇත්තෙමු. එමෙන්ම නෝට්ටු නැවීම, රෝල් කිරීම මෙන්ම නෝට්ටු ගින්නට හසුවීම තුළින්ද භාවිතයට ගත නොහැකි ලෙස විනාශ වී යයි.

නිවෙස්වල විවිධ ස්ථානවල මුදල් සඟවා තැබීම හෝ තැන්පත් කර තැබීම නිසා ඒවා මීයන්, වේයන් වැනි සතුන්ට ගොදුරු වීම බොහෝ විට විය හැකි නිසා විශාල පාඩු සිදුවේ. එමෙන්ම ඒවා සංසරණය නොවී තැන් තැන්වල හුදකලා වීම තුළින් රටේ සංසරණයට අවශ්‍ය නෝට්ටු ප්‍රමාණය අඩු වීම නිසා ඒ වෙනුවෙන් නව මුදල් නෝට්ටු නිකුත් කිරීමට මහ බැංකුවට සිදුවේ. නෝට්ටු තැන් තැන්වල

සැඟවීම වෙනුවට ඒවා බැංකුවක තැන්පත් කිරීමට පුරුදුවන්නේ නම් ඒ සඳහා තමන්ට පොලියක් ලැබෙනවා සේම ඒවාට ආරක්ෂාවක් ද සැලසෙන බව බොහෝ දෙනෙක් නොදැන සිටීම හෝ ඒ සම්බන්ධයෙන් සැලකිලිමත් නොවීම කණගාටුවට කරුණකි. සතුන්ට ගොදුරු වීමෙන් හෝ වෙනත් යම් ආකාරයකින් කොටස් අහිමි වී ගිය නෝට්ටු සඳහා මහ බැංකුව විසින් ඒවායේ වටිනාකම හෝ අර්ධ වශයෙන් ගෙවීම සාමාන්‍යයෙන් සිදුකරනු ලබන්නේ හුදු අනුග්‍රහයක් වශයෙනි. ඒ වෙනුවෙන් සැලකිය යුතු පිරිවැයක් දැරීමට ද මහ බැංකුවට සිදුවේ. බොහෝවිට යමෙක් ඉහත ආකාරයෙන් නෝට්ටු සඟවා තබන්නේ හදිසි අවස්ථාවකදී ඉක්මනින් ගැනීමට ඇති හැකියාව නිසා විය හැක. එහෙත් වර්තමානයේ ණය කාඩ් පත් ආදී විද්‍යුත් ක්‍රම මගින් ඕනෑම අවස්ථාවක මුදල් ගනුදෙනු යන්ත්‍ර මගින් ඉතා ඉක්මනින් මුදල් ලබා ගැනීමට හෝ තැන්පත් කිරීමට හැකිවීම නිසා ඒ සඳහා පුරුදු වීම තමාට පහසු වීම හා වාසි සහගත වීම මෙන්ම සමස්ත මූල්‍ය පද්ධතියට ද යහපත් වනු ඇත.

ව්‍යාජ නෝට්ටු සංසරණය ද අප වෙත ඇති විශාල තර්ජනයකි. ව්‍යාජ නෝට්ටුවක් අව්‍යාජ නෝට්ටුවකින් වෙන් කර හඳුනා ගැනීම සඳහා නෝට්ටුවකට ආරක්ෂණ සලකුණු යොදා ඇත. මෙම සලකුණු පැහැදිලිව දෘශ්‍යමාන වන්නේ පිරිසිදු නෝට්ටු තුළිනි. ඒ නිසා කිලිටි වී ගිය නෝට්ටු සංසරණය වීම තුළින් ව්‍යාජ නෝට්ටු හඳුනා ගැනීම ද අපහසුවේ.

මුදල් නෝට්ටුවක් නිරන්තරයෙන් අතින් අත සංසරණය වන්නකි. එම නිසා ඒවා විෂබීජ වාහකයෙක් මෙන්ම රෝග කාරකයක් ලෙස ද ක්‍රියා කරයි. නෝට්ටු අපිරිසිදු වීමත් සමඟ මෙම තත්ත්වය ඉහළ යයි. නැවී කිලිටි වී දුර්වර්ණ වූ මුදල් නෝට්ටුවක් අතට පත්වන ඕනෑම පුද්ගලයෙකුට තම සිතට නැගෙන්නේ අප්‍රසන්න හැඟීමකි. එමෙන්ම අප රටට පැමිණෙන විදේශ සංචාරකයෙකුට මුලින්ම තම අතට පත්වන්නේ මුදල් බැවින් මුදල් හුවමාරු කිරීමේ කවුළුවෙන් අපවිත්‍ර මුදල් නෝට්ටු ලැබීම තුළින් තම සිතට නැගෙන්නේ රට පිළිබඳව අප්‍රසන්න හැඟීමකි. සංචාරයේදී පමණක් නොව, තම මව් රට බලා ගිය පසු ද හැඟීම සිතින් පහව නොයනු ඇත.

නෝට්ටු භාවිතයේ දී පමණක් නොව කාසි භාවිතයේ දී ද පහත දක්වා ඇති ක්‍රම මගින් ඒවා හානියට පත්වීම සිදු වේ.

- කාසි උණුකිරීම
- තැලීම
- සිදුරු කිරීම
- ආභරණ සෑදීම සඳහා යොදා ගැනීම
- කැට තුළ බොහෝ කාලයක් රඳවා තබා ගැනීම

ඉහත කරුණු නිසා ද කාසි නැවත නැවත ටංකනය කිරීමට සිදුවීම තුළින් විශාල පිරිවැයක් දැරීමට සිදුවේ.

**මුදල් හිතාමතා විකෘති කිරීම පිළිබඳ නීතිමය තත්ත්වය**

මුදල් නීති පනතේ අංක 58 වගන්තිය යටතේ මුදල් නෝට්ටුවක් හිතාමතා විකෘති කිරීම, එනම් කැපීම, සිදුරු කිරීම නෝට්ටු මත යමක් මුද්‍රණය කිරීම, ලිවීම, ඒ මත යමක් ඇලවීම, ඇඳීම, මුද්‍රා තැබීම හෝ නෝට්ටුවක කොටසක් වාණිජමය ප්‍රචාර කටයුතු සඳහා යොදා ගැනීම, නෝට්ටුවක අනුකරණයක් (ව්‍යාජ නෝට්ටුවක්) සෑදීම දඬුවම් ලැබිය හැකි වරදකි.

**විධිමත් ලෙස මුදල් භාවිත කළ යුත්තේ කෙසේද?**

මුදල් නෝට්ටු හා කාසි භාවිතයේදී අප සැම සැලකිලිමත් විය යුතු යහපත් පුරුදු කිහිපයක් පහත දැක්වේ.

- මුදල් නෝට්ටු නැවීමකින් තොරව පසුම්බියක බහා භාවිතයට ගැනීම. මේ තුලින් නෝට්ටුවල ආයු කාලය වැඩි කර ගත හැකිය.
- තාපයෙන්, සීතලෙන් හා කෘමීන්ගෙන් හානි විය හැකි ස්ථානවල නෝට්ටු නොතැබීම.
- අපවිත්‍ර දෑත්වලින් මුදල් නෝට්ටු ඇල්ලීමෙන් වැළකීම.
- ලිවීම, කැපීම, ඉරීම වැනි දේ මගින් මුදල් නෝට්ටුවලට හිතාමතා හානි සිදු නොකිරීම.
- දිනපතා ගනුදෙනුවලදී තමා වෙත ඉතිරි වන කාසි දැමීම සඳහා විශේෂිත ස්ථානයක් හා බඳුනක් යොදා ගැනීමට පුරුදු වීම.
- දිනපතා සිදුකරන ගනුදෙනු සඳහා අවශ්‍ය වන කාසි ප්‍රමාණය නිවසින් රැගෙන යාම තුළින් කාසි නොමැතිව සිදු වන අපහසුව මඟ හරවා ගැනීම.
- කැට තුළ බහා එකතු කරනු ලබන කාසි හා නිකරුනේ තැන තැන තිබෙන කාසි ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කිරීමට පුරුදු වීම හා එදිනෙදා එකතුවන කාසි භාණ්ඩ මිලදී ගැනීමේදී යොදා ගැනීම.
- ආගමික ස්ථානයන්හි ඇති කැට තුළ එකතු වන කාසි බොහෝ කලක් එම ස්ථානවල නොතබා බැංකු ගිණුමක තැන්පත් කිරීම. මේ මගින් කාසි දුර්වර්ණ වීම නිසා සිදුවන හානි වළක්වා ගැනීම මෙන්ම කාසි හිඟය මග හරවා ගැනීමට ද හැකි වේ.

මුදල් නෝට්ටු හා කාසි භාවිතයේදී වඩාත් වැදගත් වන්නේ තනි තනි වශයෙන් මෙන්ම ජාතියක් වශයෙන් ද සිතා වටිනා සම්පතක් වන මුදල් නෝට්ටු හා කාසි මනා කළමනාකරිත්වයෙන් භාවිත කළ යුතු බවට දැනුම්වත් වීම හා ඒ තුළින් ආකල්පමය වෙනසක් ඇති කර ගැනීමයි. මෙලෙස නිසි ආකාරයෙන්ම මුදල් පරිහරණය කිරීමෙන් තනි පුද්ගලයාටත්, ජාතියටත් ලැබෙන ප්‍රතිලාභ අතිමහත්ය.

කාසි හා නෝට්ටු සැලකිලිමත්ව පරිහරණය කිරීම තුලින් අපට නිරන්තරයෙන් පිරිසිදු මුදල් නෝට්ටු හා කාසි භාවිතයට ගත හැකි වන අතර එමගින් ලැබෙන සතුට ද අති මහත්ය. මේ මගින් අප ජාතිය පිළිබඳ යහපත් ප්‍රතිරූපයක් අනෙකුත් ජාතීන් අතර ප්‍රචලිත කිරීමට ද හැකියාව ලැබේ.

මුදල් නෝට්ටු හා කාසි නිවැරදි පරිහරණය මගින් අප සැමට මූල්‍යමය හා මූල්‍ය නොවන, ප්‍රතිලාභ රැසකට හිමිකම් කීමට හැකියාව ලැබෙන අතර මනා කළමනාකාරිත්වයකින් මුදල් පරිහරණය කිරීමේ ජාතික මෙහෙවරකට දායක වීම පිළිබඳව ආඩම්බර විය හැකිය.

ඉදිරි පරපුරේ යහ පැවැත්ම උදෙසාත් අප සතු සම්පත්වලින් කාර්යක්ෂම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහාත් යහපත් පුරවැසියන් ලෙස අප දැඩි අවධානයකින්, වගකීමෙන් යුතුව කටයුතු කිරීම වැදගත්ය.

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# ව්‍යවහාර මුදල් නෝට්ටු විකෘති කිරීම සහ හානි කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බව ඔබ දන්නවාද?

**සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් නෝට්ටු විශාල ප්‍රමාණයක් හිතාමතා විකෘති කර සහ/හෝ හානි කර ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරීක්ෂණය කර ඇත.**




- ☑ ව්‍යවහාර මුදල් නෝට්ටු විකෘති කිරීම හෝ හානි කිරීම 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ වරදක් වන අතර සිරගත කිරීම හෝ දඩ මුදලකට යටත් කිරීම හෝ එම දඬුවම් දෙකම ලබා දිය හැකිය.
- ☑ මුදල් නීති පනත යටතේ පනවන ලද අදාල රෙගුලාසිවල (Regulation E) අංක 10 පරිච්ඡේදය යටතේ සිතාමතා විකෘති කරන ලද මුදල් නෝට්ටු ශ්‍රී ලංකා මහ බැංකුව භාරයේ රඳවා තබා ගන්නා අතර කිසිදු ගෙවීමක් සිදු නොකරයි.
- ☑ මෙම ව්‍යවහාර මුදල් නෝට්ටු සන්තකයේ තබාගන්නන් හට එම මුදල් නෝට්ටුවල මුහුණත වටිනාකමට අදාල අලාභය දැරීමට සිදු වනු ඇත.

ජාතික ධනය ඉතිරි කරගැනීම සඳහා ව්‍යවහාර මුදල් නෝට්ටු පරිස්සමින් සහ පිරිසිදුව භාවිතා කරන මෙන් ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, 30, ජනාධිපති මාවත, කොළඹ 1 FAX +94 (0)112477726 currency@cbsl.lk +94 (0)112477587

**ව්‍යවහාර මුදල් නෝට්ටුවක් මත ලිවීම, ඇඳීම, මුද්‍රා තැබීම, කැපීම හෝ හානිකිරීම වරදකි.**



# කාසි ඇත නිකරුණේ ඔබටමයි අලාබෙ

රට තුළ භාවිතයට නොගෙන නිකරුණේ තිබෙන කාසි සංඛ්‍යාව
**අති විශාලයි.**

මෙම කාසි සංසරණයට මුදා හැරීම තුළින් අලුතින් කාසි අච්චු ගැසීමට සාපේක්ෂ ව අප රටට විශාල මුදලක් ඉතිරිකර ගැනීමට පුළුවන්. කාසි අලුතින් අච්චු ගැසීමට දරන අධික වියදම ඔබට දිගුකාලීන පාඩුවක් අත්කර දීමට පුළුවන්.

ඒ නිසා ඔබ සතුව නිකරුණේ පවතින කාසි සියල්ල ප්‍රයෝජනයට ගන්න.

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.